ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

2024-06

## පළමු වාර ඇගයීම -2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය - i පත්‍රය

11 ශ්‍රේණිය

කාලය පැය යි.

විභාග අංකය. :...........................................................................

පන්තිය: :................................

උපදෙස්:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නය සඳහා දී ඇති 1234 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණු යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

අංක 1සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. <u>යල් පැන ගිය</u> තීන්දු තීරණ ඇතැම් විට යහපත් ඒවා වන්නට ද පුළුවන.
(1) කාලයට නොගැළපෙන
(2) යල මහ ඉක්මවා ගිය
(3) නවීකරණය වූ
(4) කිසිසේත් ක්‍රියාත්මක කළ නොහැකි වූ

2. සැම කාර්යයක දීම තම සේවකයන් <u>දඬමීමා කර ගැනීමට</u> වතුහිමියා පුරුදු වී සිටියේ ය.
(1) දඬයමේ යැවීමට
(2) යටත් කර ගැනීමට
(3) වෙහෙසට පත් කි මට
(4) අයෝග්‍ය ලෙස යොදාගැනීමට .

3. නලින්ද <u>**හතරවරංකාරයෙකු**</u> ලෙස මුළු රටේම කතාබහට ලක් විය.
(1) වංචනිකයෙකු
(2) බොරුකාරයෙකු
(3) වරං ලැබූවෙක
(4) මං පහරන්නෙකු

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4 ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ.....................මහින්ද හිමියෝ කවි ලියූහ
(1) කැමැත්තෙන්
(2) ස්වෙච්ඡාවෙන්
(3) උනන්දුවෙන්
(4) පරමාභිලාෂයෙන්

5. අධ්‍යාපනය ලබන සැම අයෙකුගේ ම ...................... වන්නේ සුදුසු රැකියාවකට අවතීර්ණ වීම ය.
(1) අභිලාෂය
(2) විලාසය
(3) විශ්වාසය
(4) අභිමතය

6. සිංහල සාහිත්‍යයේ ......................... උදෙසා තම වටිනා කාලය කැප කළ ලේඛකයන්ගේ සේවය සම්භාවනාවට ලක් විය යුතු ය.
(1) උත්පාතය 2) විකාශනය (3) චිරස්ථිතිය (4) ආරෝහණය

7. අකාරාදි පිළිවෙළ නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.
(1) විෂ්ණු, විසන්ධි, විශාල, විෂය
(2) කවන්ධය, කෂාය, කළපුව, කාණ්ඩය
(3) පණහ, පණාව, පණිවිඩ , පයවි
(4) සංශෝධිත, සංසරණ, සංහරණ, සංස්ථිත

8.සැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) අබරන, අත්‍යාවශ්‍ය,හෘදයංගම,ප්‍රශ්න
(2) කණිෂ්ඨ, භාශන,දන්තෞෂ්ඨජ, ඉෂ්ඨ
( 3) ඓක්‍යය, දූරකථනය, වීර්‍යය, බෝධිසර
(4) අවස්ථෝචිත, ව්‍යූහය ,ව්‍යංගාර්ථ, පරිගණක

9. දීර්ඝ ඇදය, ඉස්පිල්ල,දීර්ඝ පාපිල්ල, ගැට ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(1) වෑයම, රිලවා, භූගත, ගෘහිණිය
(2) රෑන, කිරිල්ල, මීරිගම, කෘත්‍රිම
(3) රුවනාර, සීමිත, රූමත්, සෘණ
(4) සූකිරි, කාසිය, තීක්ෂ්ණ, හෘදය

10.මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) ඔහු සෙමින් කතා කළේ ය. (2) ඇ ඔහු හා පෙමින් වෙළී සිටියා ය.
(3) වඳුරා මඳ දුරක් බිමින් ගමන් ගත්තේ ය. (4) ගෙවිලිය ගොයම් කපමින් ගීයක් ගැයුවා ය.

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මං, දැරියක, ඔවුන්, සතුරන්
(2) තොප, දනවතුන්, වීරයෙක්, සිසුන්
(3) මිනිසුන්, කිසිවෙකු, ඇතැමෙක්, සමහරුන්
(4) ගැහැනියක, කුමරියක්, හේ, මුවකු

12 මිනිසාගේ මූලික ම සන්නිවේදන ක්‍රමය කථනයයි. මෙහි සන්නිවේදනය යන පදයෙහි **සන්** යනු
(1) නිපාතයකි. (2) උපසර්ගයකි.
(3) කෘදන්තයකි. (4) තද්ධිතයකි.

13. දේවතාවෝ පවා සත් පුරුෂයන්ට ගරු කරති. මෙහි <u>පවා</u> යනු
(1) කාලාර්ථය හඟවන නිපාතයකි.
(2) අවධාරණාර්ථය හඟවන නිපාතයකි.
(3) සමානාර්ථය හඟවන නිපාතයකි.
(4) භාවාර්ථය හඟවන නිපාතයකි.

14. රිද්ම + අනුකූල යන පද දෙක එක් වූ විට නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න
(1) රිද්මනුකූල (2) රිද්මයානුකූල
(3) රිද්මානුකූල (4) රිද්මායානුකූල

- ඉරි ඇඳි පදයට වඩාත් ගැලපෙන තනි පදය තෝරන්න.

15.බොහෝ වෙහෙර විහාර <u>දීර්ඝ කාලයක් තිස්සේ නොනැසී පවතින</u> උරුමයන් ය.
(1) චිරන්තන (2) චිරාගත
(3) චිරස්ථායි (4) චිරජීවන

16. නාම ප්‍රකෘති පමණක් දක්වා ඇති වරණය තෝරන්න
(1) ගවයා, මී, රට, සිංහ (2) දරු ,මිනිස්, ගස් ,බලූ
(3) ශිෂ්‍යයා, පොරෝ ,කතුරු, පුටු (4) මේස,ගැහැනි, ලේනා, නායකයන්

17. ස්වර සන්ධිය -චමතින්
පූර්ව ස්වර සන්ධිය -සිහසුන
ස්වරාදේශ සන්ධිය -මහෝපකාර
ආගම සන්ධිය -ජනාදරය
ඉහත දක්වා ඇති ABCD යුගල අතරින් නිවැරදි යුගලය වන්නේ
(1.) B හා C ය. (2.) B හා C ය. (3.) B හා C ය. (4.) B හා C ය.

18.දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ජලාශ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) සා කැ මා ලේ වු ස් (2) ක ද මො ග ර හ ල
(3) රි ක් ම ල වි ටෝ ව (4) ර ග න් ව දෙ ල න

19. ජාතියට වැඩ කිරීම..............................මම කැප වෙමි.
ගුරුවරු දරුවන්ගේ අනාගතය..............................මම කැප වෙමි.
ජාතියට වැඩ කිරීම..............................මම කැප වෙමි.
ජාතියට වැඩ කිරීම..............................මම කැප වෙමි.
ඉහත වාක්‍යවල හිස්තැන පිරවීමට වඩාත් සුදුසු නිපාත පද අනුපිළිවෙළ තෝරන්න.
(1) ගැන, පිණිස ,වහා, මෙන් (2) නිසා, පිණිස, වහා, මෙන්
(3) පිණිස, ගැන, මෙන්, වහා (4) පිණිස, ගැන,මිස, වහා

20. දි ඇති වචන අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී නො පවත්නා පද පෙළිය වන්නේ,
(1) නඟුල,වියගහ,උදැල්ල, කමත (2) නැව, යතුරු පැදිය, බයිසිකලය, කරත්තය
(3) අක්වැස්ස, අත්තම්, ධීවරයා, මහ එකා (4) පොත, පෑන, පැන්සල, අඩිකෝදුව

21. එක් එක් පද පෙළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නො වන පද පෙළිය තෝරන්න.
(1) ඉක්මන් -සෙද , පොත -ගත , නිතර -නිබඳ , රත්තරන් -රුවන්
(2) මුහුණ -වත , භයානක - භීම , වීදිය - වේ , අඹ -ජලය
(3) සඳ -සිසි , සිරුරු-වෙර, මහත - ස්ථූල , ලණුව - යොත
(4) අශ්වයා -හය, කුරුල්ලා -සකුණ , උතුම් -පවර , උවදුර -පිරිපත

22. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක් ද?
(1) ආගමන -විගමන (2) ස්ථාවර-ජංගම
(3) ආහ්ලාදය -ප්‍රමෝදය (4) ඍජු -වක්‍ර

23. මිශ්‍ර ක්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දුඩි වේදනාවෙන් මිරිකී හඬනු ඇසේ
(2) අතරමං වී හුනිමි සිහින සිතිවිලි අතර
(3) නැබළ පටළ පෙළ ලෙළවමිනි කෙළ කෙළ
4) එළියක් පෙනෙන විට හිමියනි වෙරළබඩ

24. නිවැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) ය, ර, ළ, ව, ස යනු ඝෝෂාක්ෂර යි
(2) රේඵය උච්චාරණය කෙරෙන්නේ ව්‍යංජනාක්ෂරයකට පූර්වයෙනි.
(3) යංශය හා 'ය' අක්ෂරය අතර වෙනසක් නො පෙනේ.
(4) පාපිල්ල, ලියා දැක්වීම සඳහා සිංහලයේ යෙදෙන්නේ එක ම රූපයකි.

25. මූර්ධජ අක්ෂරයක් සහිත පදයක් යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) ආණ්ඩුව, වරප්‍රසාද, ආර්ථික, නිශ්චිත
(2) විශ්වසනීය, සාහිත්‍යයික, නික්ලේශ, අභව්‍ය
(3) නිවර්තන, අනුකලන, සංවෘත, ආශ්චර්ය
(4) න්‍යාය, නිවැරදි, අස්ථාවර, කර්කශ

26. උපසර්ගයක් සහිත පදයක් යෙදී නැති පද පෙළිය තෝරන්න.
( 1) අවමංගල්‍යය, ප්‍රාමාණික, අනුවර්තන, පරිබාහිර
(2) නිරායාස, මාත්සර්ය, සංවර්ධන, අනාවරණ
(3) අභ්‍යුදය, සසොබන, පරිභ්‍රමණ, ප්‍රලේඛන
(4) ප්‍රතික්ෂේප, ආගමන, පරහිතකාමී, අපිවර්ම

- අංක 27, 28, 29 යටතේ ඇති ප්‍රස්තාව පිරුවලට වඩා ත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

27. එළිපත්ත උඩ ඉන්න බළලා වගේ
(1) ස්ථිර තීරණයක් නැති බව
(2) සුදුසු රැකවරණයක් නැති බව
(3) අනවබෝධයෙන් යමක් කිරීම
(4) අසිහියෙන් කටයුතු කිරීම

28. නරියා පඹගාලේ පැටලුණා වගෙයි
(1) කවරෙකුට වුවත් බලවත් ගැහැට විඳීමට සිදුවෙයි
(2) ප්‍රයෝගකාරයා ද උගුලට අසු වෙයි
(3) අතිදක්ෂයින්ට පවා ගැටලු ඇති වේ.
(4) අපල කාලයේ දි විපත් පිට විපත් ඇති වේ.

29. ඇඟෙන් ඇටයක් ගියා වගෙයි
(1) ඉතා කැමැත්තෙන් යමක් දීම
(2) ඉතා සතුටින් යමක් දීම
(3) ඉතා අකැමැත්තෙන් යමක් දීම
(4) ඉතා ඕනෑකමින් යමක් දීම

• අංක 30, 31,32යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

30. (1) අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
(2) ඔවුහු දක්ෂ ශිෂ්‍යයෝලු.
(3) ගොන්නු දෙදෙනෙකු ගැල ඇද්දාහ.
(4) වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්ට වූහ.

31. (1) සියලු සත්වයෝ සත්‍යගරුක විය යුත්තෝ ය.
(2) ඔවුහු තුමු ගී කීමට වන්නෙහි.
(3) සියලු නදීහු ඇද ව ගමන් කරන්නේය.
(4) දක්ෂ ගායකයෙක් වන්නේ කෙසේ ද?

32. (1) සිසු කැල චාරිකාවේ යෙදෙයි.
(02) ධ්වජ පන්තීන් සුළාගේ ලෙළ දෙති.
(03) පලබර අඹ වෘක්ෂයෝ සතුනට ආහාර සපයයි.
(04) ඔවුන් එය දැන ගැනීම මැනවි.

33. පහත දක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,
**කාලෙ හැටියට අපි වෙනස් වෙන්න නෑ කියල මම පිළිගන්නවා.**
(1) කාලානුකූලව අප වෙනස් කළ යුතු බව මම පිළිගනිමි.
(2) කාලය අනුව අප වෙනස් වීමේ අවශ්‍යතාව මම පිළිගනිමි.
(3) කාලයටඋචිත පරි දිඅපි වෙනස් විය යුතු බව මම පිළිගනිමි.
(4) කාලෙ හැටියට අප වෙනස් විය යුතුයි කියල මා පිළිගනිමි.

34. පැණි කොමඩු පද්‍ය පන්තිය රචකයාගේ නම සහිත වරණය තෝරන්න.
(1) රුවන් බන්දුජීව (2) ඒ වී සුරවීරගේ ය
(3) රත්න ශ්‍රී විජේසිංහ (4) ඩබ්ලිව් ඒ අබේසිංහ

35. උපමා අලංකාරයක් රහිත වරණය තෝරන්න.
(1) ඇත් ගිනි කඳක් සේ කිපි කිපී බුදුන් කරා දිවනුවේ
(2) ආකාශයේ පිපි වැනි ගිය තරු කැලක් සේ පිරිවරා සිටිනා
(3) ලකළ ගුවන් තල සිරි යහන තිකසළ
(4) බුදුන්ගේ ආනුභාවයෙන් පොළොව කුඹල් සකක් සේ පෙරළී උන් වහන්සේ පසු කොට

36. පිරුවානා පොත් වහන්සෙ
කනප්පු වේ පෙරළී ඇත
මීදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ
මීදුලේ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩ බුරනු ඇසේ

යන කාව්‍යයේ ආකෘතිය වන්නේ
1) ගී කාව්‍යය (2) සිවුපද ආකෘතිය යි
(3) නිසඳැස් කාව්‍ය ආකෘතියයි (4) සැහැලි කාව්‍ය ආකෘතිය යි

37. පහත සඳහන් කවියේ හතරවන පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.
ඇත්ත තමයි පවසන්නේ නියම කොට
සත්ත ඇති නැකත් සුබ හෝරා එවිට
තිත්ත නිරන්තර දෙවියන් මදුන් කොට
.................................................
(1) අත්වල අත අල්ලනු මරු මුවා කොට
(2) කැත්ත ගෙනැත් ගෙවඩින් මුල් පඳුරකට
(3) සුරිඳුනි කිදිරපුර ලැබ දෙනු මැන පිහිට
(4) රුක් අත්තන පෙනෙන් පලු බෝ මී කහට

38. අ - අඟුරු කිරෙන් සේදුවත් සුදු නොවේ.
ආ - වැල යන අතට මැස්ස ගහන්නා සේ
ඇ - ලෑල්ලට පාගලා ගියා
ඈ - සැලෙන පහන් සිළු වැනි රහන ලිය සැදී

ඉහත වගන්තියේ නිවැරදි පිළිතුර වන්නේ

(1) ආප්තෝපදේශලප්‍රස්තාව පිරුළුල උපමාල රූඪී පද
(2) ආප්තෝපදේශල ප්‍රස්තාව පිරුළුල රූඪී පදල උපමාවක්
(3) ප්‍රස්තාව පිරුළුල ආප්තෝපදේශල රූඪී පදල උපමාවක්
(4) ප්‍රස්තාව පිරුළුල ආප්තෝපදේශල උපමාවක්ල රූඪී පද

39. පහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියා පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න ,
වෙළෙන්දා පොළට ගොස් බඩු ගනිද්දී මිතුරෙක් පිටට තට්ටු කළේය.

(1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(2) පූර්ව ක්‍රියා,ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා , අවසාන ක්‍රියා
(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා පූර්ව ක්‍රියා,, අවසාන ක්‍රියා

40. පහත පාඨයේ අදහසට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
"භාෂාව යනු නිර්මාණකරුවාගේ සාහිත්‍ය මෙවලමයි. මිනිස් සිතේ හටගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි ."

(1) භාෂාව යනු නිර්මාණ කරුගේ සිතේ හටගන්නා භාවයන් ප්‍රකාශ කරන උපකරණය වන අතර එය මිනිසාගේ සාහිත්‍ය මෙවලමයි .
(2) මිනිස් සිතේ හටගන්නා භාවයන් ප්‍රකාශ කරන මාධ්‍ය ය භාෂාව වන අතර, නිර්මාණ කරුවාට සාහිත්‍ය උපකරණය ද වෙයි.
(3) සාහිත්‍ය මෙවලම ලෙස නිර්මාණකරුවා භාෂාව භාවිත කරන අතර, එයින් මිනිස් සිතේ භාවයන් හට ගනියි.
(4) මිනිස් සිතේ භාවයන් හට ගන්නේ සාහිත්‍ය නැමති උපකරණයෙන් වන අතර, එය නිර්මාණ කරුවාගේ භාෂා මාධ්‍යය යි.

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

2024 06.

## පළමු වාර ඇගයීම -2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය -ii පත්‍රය

11 ශ්‍රේණිය

කාලය පැය දෙක යි.

විභාග අංකය. :................................................ පන්තිය: :..........................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න මෙම පත්‍රය සඳහා ලකුණු 80 කි.

1. (අංක (i)සිට (X) තෙක් සියලු ම ප්‍රශ්න සඳහා කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
 (අ) නුවණ -
 (ආ) නුවන -

(ii)සිංහල හෝඩියේ ඇතුළත්
 (අ) අනුනාසිකය
 (ආ) අර්ධ ස්වර අක්ෂරය බැගින් ලියන්න.

(iii)පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග සහිත පද දෙකක් උපුටා දක්වන්න.
 වැඩිහිටියන්ගේ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් තම අභිවෘද්ධිය ළඟා කර ගත හැකි ය.

(iv)පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
 (අ) කාලයට උචිත -
 (ආ) සහමුලින් ම උදුරා දැමීම -

(v) පහත සඳහන් පද්‍ය ඛණ්ඩවල තද කළුකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.
 (අ) **බිලුවූ** පොළොන්නරු අනුරාපුර පෙදෙස
 (ආ) උනන්දු **වූවහොත්** විභාගය සමත්විය හැකි ය.

(vi) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
 අද අප තාක්ෂනික වශයෙන් මනා පදනමක සිටින අතර ජනගහනය විවිධාංගීකරනය වී තිබේ.

(vii)පහත සඳහන් ප්‍රාදේශීක ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
 (අ) ගහමප-
 (ආ) දොරං -

(viii)පහත පද වලට විරුද්ධාර්ථවත් පද ලියන්න.
 (අ) ආශ්‍රය -
 (ආ) පැළඳිග -

(ix)පහත දක්වෙන වාක්‍ය සදොස් නම් ඒවා නිදොස් කර ලියන්න.
 (අ) කම්කරුවෝ පස් දෙනෙකු පාර තනා නිම කළහ.
 (ආ) අපි රෝගීන්ට උපස්ථාන කරනු වටී.

(x) පහත දක්වෙන කතෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.
 (අ) වෛද්‍යවරු. ලෙඩ රෝග පිළිබඳ රෝගීන් දැනුවත් කළහ.
 (ආ ) කාන්තාවෝ විචිත්‍රවත් රංගනයක යෙදෙමින් රසිකයන් සතුටට පත් කරති

(ලකුණු 02 x 10 = 20)

2. පහත දක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන, වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න.

(අ) අධ්‍යාපනය යනු පුද්ගලයකු නියෝජනය කරන සමාජ පන්තිය වෙනස් කරන සාධකයකි. එය තමා සිටින තත්ත්වය ඉහළට ඔසවා තැබීමටත් රටට දැයට සේවය කිරීමටත් ලැබෙන මහඟු අවස්ථාවකි. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල සියල්ලන්ට ම භුක්ති විඳීමට ලැබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන හොඳින් ඉගෙනීමෙහි නිරත වීම ළමා පරපුරෙහි වගකීමයි.

(ආ)ජංගම දුරකථන භාවිතය මේ වන විට බෙහෙවින් ව්‍යාප්ත වී ඇත. ගෝලීයකරණය සමඟ ඇතිවී තිබෙන නව විපර්යාස හමුවේ සන්නිවේදනය කාර්යය පහසු කිරීමේ ලා මෙවැනි නව තාක්ෂණික මෙවලම් මහෝපකාරී වේ. එහෙත් ඒවා තුළින් අසන්නට දකින්නට ලැබෙන දේවල් කිසිදු තහනමකින් හෝ සීමාවකින් තොරව ලබා ගැනීමට හැකි වීම ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි. එබැවින් මෙවැනි විද්‍යුත් මෙවලම් අවිචාරයෙන් පරිහරණය වැළකීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි ය.

(ඉ)මිනිසා ඇතුළු සියලු ජීවීන්ට ජලය අත්‍යවශ්‍ය සාධකයකි. සාගර, මුහුදු,විල් ගංගා, වැව් ආදී ජල මූලාශ්‍රවල ඇති ජල ප්‍රමාණය ඉතා වුවත් මිනිසාගේ භාවිතය සඳහා ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඉතා අල්පය, වර්තමානය වන විට විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල සම්පත විනාශ වෙමින් පවතී. මේ සඳහා ඉතා ඉක්මනින් නිසා පියවර නොගත හොත් මිනිසා ඇතුළු සියලු ජීවීන් නො සිතූ විරූ උපද්‍රවයකට පත් වීම වැළැක්විය නොහැකි වනු ඇත.

(ඊ) ගගන ගවේෂණ කටයුතුවල යෙදෙන ඇමරිකාවේ නාසා ආයතනය මගින් ලද ආරාධනයකට අනුව අගහරු ගවේෂණ චාරිකාවකට යෑමට මට අවස්ථාව උදා විය. කැනඩාවේ හා පකිස්තානයේ මගේ වයසේ මිතුරන් දෙදෙනෙකුට ද මෙම චාරිකාවට වරම් සහභාගි විය. එම අත්දැකීමේ චමත්කාරජනක බව මිතුරන්ට පවසයි.

(ලකුණු 25 යි)

3. පහත දක්වෙන පාඨය වචන 50-55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

පිණිස අතීතයට යන විට ආගමික පුද පූජා පැහැදිලි කඩ ඉමක සනිටුහන් කරයි.ග්‍රීක නාට්‍ය දෙස
නාට්‍යයේ ප්‍රභවය ගැන කරුණු සොයනු ... ඩයනීස් දෙවියන් ගෞරව කිරීම වස් කරනු ලැබූ ගායනා තුළින්
බලන විට දේව විශ්වාසයන් හා නාට්‍යයත් අතර ඇත්තේ දැඩි සබඳතාවකි ඩයනීස් දෙවියන් ගෞරව කිරීම වස් කරනු ලැබූ ගායනා තුළින්
බලන විට දේව විශ්වාසයන් හා නාට්‍යයත් අතර ඇත්තේ දැඩි සබඳතාවකි "ප්‍රණාමය සිරසාදේවා" යනුවෙන් බ්‍රහ්ම,ඊශ්වර දෙදෙනා
ග්‍රීක ඛේදාන්ත නාට්‍ය ප්‍රභවය දැකිය හැකි ය. භාරතීය නාට්‍ය ඇරඹුනුයේ ද " ප්‍රණාමය සිරසාදේවා" යනුවෙන් බ්‍රහ්ම,ඊශ්වර දෙදෙනා
නැමදීමෙනි. නාට්‍යකරණයේ දී 'නාන්දි' යනුවෙන් පෙන්වා දෙන්නෙ මෙම පූජනීය ස්වරූපයයි. මේ අනුව ලොව පැරණිම නාට්‍ය සම්ප්‍රදාය
වන ග්‍රීක නාට්‍යවලත් ඉන් අනතුරු ව බිහිවන සංස්කෘත නාට්‍යවලත් ප්‍රභවය සම්බන්ධයයෙන් ආගම මුල් වී ඇති බව පැහැදිලිව පෙනෙන
කරුණකි.

කෙසේ වෙතත් නාට්‍ය යනු දෘශ්‍ය කාව්‍ය විශේෂයකි.එය ලෝක ධර්මී ලෙස දෙයාකාර වේ. සම්ප්‍රායික ලකුණ පිළිබිඹු කරන කිසියම් ශෛලියකට අනුව ලොව අනුසාරණය කිරීමේ ක්‍රමය නාට්‍ය ධර්මී හෙවත් ශෛලිගත වේ සිදුවීමකින් හෝ පුවතක් පිළිබඳ අවස්ථාවක් ඒ අයුරින් දැක්වීම ලෝක ධර්මී හෙවත් ස්වභාවික නාට්‍ය නම් වේ. කවර ශෛලියකින් වුව අර්ථවත් අත්දැකීමක් ලබා දී කැළඹීමකට හසුකොට ආනන්දයෙන් ආරම්භ ව ප්‍රඥාවෙන් කෙළවර වන අයුරු කලා මාධ්‍ය නාට්‍ය නම් වේ.

(ලකුණු 10 යි)

4. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

| | |
|---|---|
| | බැඳී |
| සිව් සඟරාවතින් දස රජ දමින් | දෑ |
| සව් ලෝ සතට කුලුණින් සව් ඉසුරු | රැඳී |
| දෙව් රජවරුන් වැනි මහ රජවරුන් | ලදී |
| දෙව් ලෝ සිරිය පෙර අප සිරි ලකෙහි | |
| | තැන |
| සුසිරිත මිසක දුසිරිත කිසි තැනෙක | ඇත |
| රිසි වන සියලු යසිසුරු රිසි ලෙස ම | ගත |
| නිසි කල වැසි ද සස් පල නැඟි නැඟී | පත |
| මෙ සියල් සැපෙන් සිරි ලක ලෝ මුදුන් | |
| | සැම |
| සබවස කුලුණු මෙත් මුදිතා දහම් | තම |
| සැබවින් රකිති මහ දන දිවි ලෙසින් | මම |
| මොබ තව කුමට සොයම් ද නව උවම් | බිම |
| මෙමම ලක තමා එවකට එක දහම් | |

(එස් .මහින්ද හිමි)

(i) සිරිලක දෙව්ලොවක සිරිය ගත් කරුණු දෙකක් සඳහන් කරන්න.
(ii) සිව්සඟරාවත යනු කුමක්ද ?
(iii) සිරිලක ලෝකයේ අගතැන ගෙන සිටින්නේ කුමකින් ද?

(iv) ජනයා දිවි දෙවෙනි කොට රකින්නේ කුමක් ද?

(v) පහත සඳහන් වචන සඳහා සමාන පද කවියෙන් උපුටා ලියන්න. (ලකුණු 10 යි)

(අ) සත්‍යවචන -

(ආ) උපමා -

5. ගම්පහ සිංහ සමාජය සංවිධානය කරන බෝනොවන රෝග වෛද්‍ය සායනයක් 2024.07.26 දින පෙ.ව.10.00 සිට පස්වරු 3.00 දක්වා ජයසිරිගම ප්‍රජාශාලාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත. මෙදින බෝනොවන රෝග වෛද්‍ය විශේෂඥයෝ කිහිප දෙනෙක් සහභාගි වෙති. ආර්ථික දුෂ්කරතා ඇති අය වෙනුවෙන් නොමිලේ වෛද්‍ය පරීක්ෂණ ලබාදීමට ද තීරණය කර ඇත. මේ පිළිබඳ ව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය)

නැතහොත්

තමාගේ පාසලට මෙන් ම රටට ද ඉමහත් ගෞරවයක් ගෙන දුන් ආචාර්ය ජීවන්ති රණතුංග කලාභූෂණ සම්මාන දිනා ගමට පැමිණෙන උත්සවය සංවිධානයත්, පාසලේ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ල එතුමියගේ නමින් නම් කිරීමටත් මහවැව ගැමුණු මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ මහසභා රැස්වීමේ දී ඉදිරිපත් වූ යෝජනා ව ඒකමතික ව සම්මත කෙරේ.ඒ සඳහා විදුහල්පතිතුමාගේ අවසරය ලබා ගැනීමේ කාර්යය සඳහා සමිතියේ ලේකම් එම්. සෝමසුන්දර මහතා ඔබ යැයි සිතා මහවැව කලාප කාර්යාලයේ පූර්ව අනුමැතිය ලබාගැනීමට අධ්‍යක්ෂතුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

# පළමු වාර ඇගයීම -2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය - iii පත්‍රය

11 ශ්‍රේණිය

කාලය පැය දෙක යි.

විභාග අංකය. :.......................................................................... පන්තිය: :...............................

---

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
  1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

  සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න මෙම පත්‍රය සඳහා ලකුණු 80 කි.

**(01) අංක (01)සිට (10) තෙක් ඇති සියලු ම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) එකල්හි ගොන් රක්නාහු. වසසන් රක්නාහු. සහන්නාහු, ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදු රැස් නො විහිදැ වඩනුවන් දැකැ නො හැඳිනැ "මහණ එ මඟැ අඟුල්මල් නම් සොරෙකැ, දරුණැ, ලෙහෙ මුඩු අත් ඇත්තෙ යැ"

(අ) අඟුලමල් නමින් මේ සොරා හැඳින්වූයේ ඇයි?

(ආ) මාර්ගයේ දී බුදුන් වළකාලීමට උත්සාහ කළ සතර දෙනා කවුරුන්ද?

(02) (අ) වූ චෙං එන් විසින් රචිත "The Monkey" කෘතිය සිංහලට පරිවර්තන කළේ කවුරුන් ද?

(ආ) **'අවුරුද්ද පහු වෙලත් දැන් මාස හයක් වෙනවා'** මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද?

(03) "පැසුණු ගොයම් මුල් වුවා සේ දුක් ගෙන උගත් ශිල්පය සිස් වී ය'යි සිතූහ."

(අ) මෙම පාඨය උපුටා ගත් කෘතිය සහ කතුවරයා සඳහන් කරන්න.

(ආ) මෙසේ සිතුවේ කවුරුන් ද ?

(04) ඇස නැතිදා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්න ද
.........................................................
.........................................................

(අ) ඉතිරි කවි පාද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙම ජනකවි කුමන වර්ගයට අයත් ජනකවි ද?

(05) "තෙල අහස සිට නැටූ විද්දත් දුවගේ පියාට දී ලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියවා"

(අ) මෙහි විද්දත් පියාට දෙන්න යැයි කීවේ මොනව ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරකු ද?

(06) (අ) ජනකවි ආරම්භ වූ යුගය කුමක්ද?

(ආ) ජනකවි ආරම්භ වූ බව සඳහන් ව තිබෙන මූලාශ්‍රය සඳහන් කරන්න.

(07) (අ) බැද්දේගම නවකතාව සිංහලට නැඟූ රචකයාගේ නම ලියන්න.

(ආ) අපට නියමිත කොටසේ පරිච්ඡේදය සඳහන් කරන්න.

(08) ''ඒ උපාය ඉතා යහපත, සෙට උදැසන ධර්ම යුද්ධය වන්නේ ය. ඉදින් ධර්ම යුද්ධයට නො අවු නම් එයින් පැරැද්දා නම් වන්නේ යැ"

(අ) මෙසේ පණිවිඩය යවන්නේ කාට ද?

(ආ) ධර්ම යුද්ධයේ දී භාවිත කළ උපක්‍රමය කුමක් ද?

(09) ''සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නෙ"

(අ) මෙම ප්‍රකාශය කරනුයේ කවරකු විසින් ද?

(ආ) මෙම පද්‍ය ඛණ්ඩය උපුටා ගත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(10) ''මහණෙනි ම පුතුන් වැන්නනවුන්ට භයෙක් කොයින් ද?"

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

(ලකුණු 2x10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(01) ඔයින් ''තොප ගිය මැන, හුන මැනව, තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම කිම් දැ? යි කියාලා අවකපප්පනයෙන් සැඳූ හසු රැන් අල්වා ඇදි ඇදි සෙ දුවන්නා සෙ ඒ ම කිය කියා පුතු නළවයි.

(අ) මෙහි පුතු නළවන තැනැත්තිය සැමියා කෙරෙහි දැක්වූ ආකල්පය කෙබඳු ද?

(අ) 'අවකප්පනයෙන් සැඳූ හසු' යන්නෙහි අදහස ලියන්න.

(02) ''වේදෙහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඬනා සේ කඩුවෙන් කපා පියා දෙපයින් මැඩ ගෙන හිඳ ජය පානය බොමිහ."

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාව හා උපමේය වෙන් කොට ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(03) ජාතිය රන් විමනක්    වේ
ආගම මිණි පහනක්    වේ
එය රැක ගන්නට මේ ලො    වේ
සමත් වෙතොත් පුත නුඹ    වේ

(අ) මේ කවියේ සඳහන් රූපකාර්ථවත් යෙදුමක් උපුටා දක්වන්න.

(ආ) කවිය රචනා කළ කවියා සඳහන් කරන්න.

(04) සිය පින් සිරින්    සරු
දෙතිස් ලකුණෙන්    විසිතුරු
කෙලෙසුන් කෙරෙන්    දුරු
වඳිම් මුනි උතුමන්    තිලෝගුරු

(අ) මෙම කවිය ආරම්භ කර ඇත්තේ කුමන ගණයකින් ද?

(ආ) මෙම පද්‍යයේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

(ලකුණු 4x05= 20)

03. (අ) සිලිඳුගේ චරිතයත්

(ආ) පුංචි මැණිකාගේ චරිතයත්

බැද්දේගම නවකතාව තුළ නිරූපණය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

(අ) ගුත්තිල කාව්‍ය කතුවරයා තම කාව්‍ය රසවත් කිරීම සඳහා

(ආ) ජීවමාන අයුරින් අවස්ථා නිරූපණය කිරීමටත්

මෙම විරිත් භාවිත කිරීමත් තුළින් තම ප්‍රතිභාව ප්‍රකට කරයි. එක කරුණකට නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරමින් නිර්දිෂ්ට කොටස ඇසුරෙන් විස්තර කරන්න.

4 (අ) සංවාදශීලී බස් වහරත්

(ආ) සංක්ෂිප්ත භාෂා ලක්ෂණයත්

හේතුවෙන් අමාවතුර ඉතා විශිෂ්ට ගණයේ නිර්මාණයක් ලෙස අගය කළ හැකි වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න

නැතහොත්

(අ) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්

(ආ) පොදු ජන වහර යොදා ගැනීමත්

,හානා හීය පාකා අඬහැරෙන් දැනේ යන ජන කවි පෙළ පාඨකයාගේ සිත්ගනී. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් නිර්දිෂ්ට කොටස ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු -15)

**5, 6, 7 යන ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුර ලියන්න.**

(5) පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා 'ජාතික කොට්ල්ල' පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගී කර ගත හැකි ආකාරය උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

(6) මිනිස් දිවිය සහ සොබා දහම සංකලනය කරමින් ජීවන දර්ශනයක්ද මතුකොට දැක්වීමට කවියා ගෙන ඇති උත්සහය කෙතෙක් දුරට සාර්ථක වී ඇද්දැය යි ,ගංගාවේ සංගීතය පැදිපෙළ ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

(7) උම්මග්ග ජාතක කථාවේ සාර්ථකත්වයට එක් හේතුවක් වී ඇත්තේ එහි යොදාගත් භාෂා රීතියයි. නියමිත කොටස ඇසුරෙන් නිදසුන් තුනක්වත් ගෙනහැර දක්වමින් මේ කියමන සාකච්ඡා කරන්න.

**(ලකුණු -10)**